# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 7 දරන රණවිරු සේවා අධිකාරි (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 පෙබරවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2009 අංක 7 දරන රණවිරු සේවා අධිකාරි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 පෙබරවාරි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 43/2007.

## 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මෙම පනත 2009 අංක 7 දරන රණවිරු සේවා අධිකාරි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් අනතුරුව ඒ වෙනුවට පහත දක්වා ඇති උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) අධිකාරියේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මින් මතු "මණ්ඩලය" නමින් හඳුන්වනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරිය යුතු වන්නේ ය :—

(අ) ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(ආ) ශ්‍රී ලංකා යුධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ;

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ;

(ඈ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ;

2—PL 003555—3,500 (2009/01)

(ඉ) සුභ සාධක කටයුතු විෂයභාර නියෝජ්‍ය පොලිස්පති ;

(ඊ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු ; සහ

(උ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් පස්දෙනකු (මෙම පරිච්ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු මින් මතු "පත් කළ සාමාජිකයා" වශයෙන් හැඳින්වේ.)

(1අ) රාජ්‍ය ආරක්ෂක විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ පවතින සේවා වනිතා ඒකකයන්හි සභාපතිනියන්හට නිරීක්ෂකයන් වශයෙන් රණවිරු සේවා අධිකාරියේ කළමනාකරණ මණ්ඩල රැස්වීම්වලට සහභාගීවීමට හැකි ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් අනතුරුව ඒ වෙනුවට පහත දක්වා ඇති උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ (උ) පරිච්ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන්ගෙන් දෙදෙනකු පිළිවෙලින් මණ්ඩලයේ සභාපති සහ උපසභාපති වශයෙන් ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු වන්නේ ය.".

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.